# ජාතක කථා වස්තු විෂය කරගත් සිංහල ගී කාව්‍ය සාහිත්‍යය

බෝලියද්දේ ධම්මකුසල හිමි

Different kind of themes and contents have been used by the authors, in prose literature of Sinhala which descended form Amavatura and Dharmapradeepikava and develop up to modern Sinhala novels and short stories, and in poetic literature of Sinhala which originated form Sigiri Gi and develop up to Sadas and Nisadas. Selecting Buddhist themes is a main feature of Sinhala prose and poetic literature in medieval literary period. Specially, the Sinhala poetic writers paid their main attention to select Jataka tales in Pansiyapanas Jataka book for their literary works. Therefore, the influence of Buddhist religion can be identified as a main future of traditional poetic literature as it was creatively composed by using Buddhist themes. Accordingly, this is an attempt to study Sinhala Jataka Gi Kavya literature initiated form Anuradhapura period.

## හැඳින්වීම

දහම් කරුණු හෝ බුදු සිරිත හෝ පදනම් කරගෙන ලියවුණු ධර්ම ප්‍රදීපිකාව, අමාවතුර කෘතිවලින් ආරම්භව නූතන නව කතාව කෙටි කතාව ආදි ග්‍රන්ථ දක්වා විකාශනයට පත්ව ඇති ගද්‍ය සාහිත්‍යයත් සීගිරි ගීවලින් ආරම්භව නූතනයේ බිහි වී ඇති සදැස් නිසදැස් පද්‍ය රචනා දක්වා පද්‍ය සාහිත්‍යයත් අවධානයට ගත්විට මේ සාහිත්‍ය පරම්පරා අතර යුගයෙන් යුගයට වස්තු විෂය හා සන්දර්භය අතින් ඇති වූ විවිධ වෙනස්කම් දැකිය හැකි ය. මධ්‍යතන යුගයේ ගද්‍ය පද්‍ය රචකයන්

බෞද්ධ තේමාවන් වස්තු විෂය ලෙස තොරා ගැනීමට යොමුවීම සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යයේ කැපී පෙනෙන ලක්ෂණයකි. විශේෂයෙන් සිංහල පද්‍ය සාහිත්‍යකරුවන් විසින් සිය නිර්මාණයන්හි වස්තු විෂය සඳහා පන්සිය පනස් ජාතක කතා පොතේ අන්තර්ගත විවිධ කථා වස්තු තොරා ගැනීමට මුඛ්‍ය අවධානය යොමු කෙරෙයි. නිර්මාණාත්මක බවින් අනූන පැරණි සිංහල කාව්‍ය ග්‍රන්ථවලට බෞද්ධ ආගමික තේමාවන් අන්තර්ගත වීම නිසා ම බෞද්ධ ආගමික බලපෑම සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයේ මුඛ්‍ය ලක්ෂණයකි. ඒ අනුව අනුරාධපුර යුගයෙන් ආරම්භව විකාශනය වන ජාතක කතා වස්තු විෂය කරගත් සම්භාව්‍ය සිංහල ගී කාව්‍ය සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනයක් කිරීම මෙම ලිපියේ මූලික අරමුණ වෙයි.

## ප්‍රවේශය

සිංහල පද්‍ය සාහිත්‍යය ගී කාව්‍ය ආකෘතිය මූලික කර ගනිමින් ආරම්භව ස්වාධීනව විකාශනය විය.[1] ආරම්භක පද්‍ය සාහිත්‍ය අනුව එහි ආකෘතියට හෝ වස්තු විෂයට හෝ කිසිදු සීමාවක් තිබූ බවක් නොපෙනේ. පද්‍ය කාව්‍ය නිර්මාණකරණයේ දී නිර්මාණකරුවන් විසින් ආගම්වාදී පටු වෛෂයික සීමාවන් තුළ කොටු නොවී පූර්ණ ස්වාධීනත්වයකින් සිය නිර්මාණ කරන ලද බව සීගිරි ගී අධ්‍යයනය කිරීමෙන් වැටහෙයි.[2] ඒ බව සීගිරි බෙයදෙහි සටහන් වී ඇති බොහෝ කුරුටු ගීවලින් ප්‍රකාශ වේ. මාර්ටින් වික්‍රමසිංහ සීගිරි ගී ගැන සිංහල සාහිත්‍යයේ නැඟීම කෘතියේ මෙසේ විමසා බලයි. ''සීගිරි බිත්තියෙහි දක්නා ලැබෙන මේ හා වෙනත් මෙවැනි පද්‍යයන් ගැන පරණවිතාන මහතාගේ විවේචනයක්ය මේ යඃ මේ පද්‍ය රචකයෝ තමන්ගේම සොයා බැලීමට ද හැඟීමට ද අනුව තමන්ගේ සිත් ගත් දේ වර්ණනා කරති. තමන් යොදන උපමානය හෝ උපමාව හෝ ආලංකාරිකයන් විසින් සම්මත කරන ලදදැයි සොයනු පිණිස ඔවුහු නොවෙහෙසෙති. තමන් කියන්න පාඨකයන්ගේ සිත් කාවදී නම් තමන් දන්නා තමන්ගේ ගම් පෙදෙසෙහි සුලභ දේ හා සසඳා කීමට ඔවුහු ප්‍රමාද නොවෙති...''[3] සීගිරි කුරුටු ගීයට බුදු සිරිත හෝ බුදු දහම පාදක වී නැත. ප්‍රේමයේ සුන්දර බව මෙන් ම ප්‍රේමයේ අසුන්දර බව ද සීගිරි කවියාගේ විෂයක්ෂේත්‍රයට අන්තර්ග්‍රහණය විය. එපමණක් ද නොව, ශෘංගාරාත්මක සංකල්පනා, සරාගී හා විරාගී චින්තන, ධර්මෝපදේශ, විශ්ව ධර්මතා, ප්‍රහේලිකා ආදි නන්වැදෑරුම් ස්වාධීන තේමාවන් ඔස්සේ කාව්‍ය සංකල්පනා සීගිරි පද්‍ය තුළ විද්‍යමාන වේ.

සීගිරි කැටපත් පවුරේ ගීවලින් වැඩි කොටසකට වස්තු විෂය වී ඇත්තේ සීගිරි බිත්තිවල ඇඳ තිබෙන සිතුවම් ය. සමහර කවියෝ සීගිරි පර්වතය ගැන ලියූහ. තවත් සමහරෙක් කැටපත් පවුර ගැන ලියූ අතර ඇතමෙක් සිංහ රූපය ගැන ගී ලියූහ. තවත් අය සීගිරි ගල මුදුනෙහි පිහිටි රජ මැදුර මාතෘකා කොට ගී ප්‍රබන්ධ කළහ. හැම දෙයටම වඩා එහි පැමිණියවුන්ගේ සිත් ගත්තේ බිතුසිතුවම්ය. බුදු දහමින් පෝෂිත වූ රටක් නිසාදෝ බුදු දහමේ ජන්ම භූමියවූ භාරත දේශයේ දැවැන්ත සෙවණැල්ල පැරණි සිංහල දේශජ කවිත්වය මත ද වැටිණ. සිංහල කවියේ දේශීයත්වය මත පමණක් නොව, සිංහල කවියා සතු වූ සහජ ප්‍රතිභාවත්, නිර්මාණ ශක්තියත් පූර්වෝක්ත භාරතීය බලපෑම හමුවේ ආවර්ණ වූ බව පැහැදිලිය

සිංහල කවිය හා එහි වස්තු විෂය සොයා යන්නෙකුට අතිශයෝපකාරී වනුයේ සියබස්ලකර යි. භාරතීය මහා කවී දණ්ඩින්ගේ කාව්‍යාදර්ශයේ ඡායානුවාදයක් ලෙස සියබස්ලකර ප්‍රතිනිර්මාණය වී ඇත. සංස්කෘත සාහිත්‍යයේ සුභාවිත සාරගර්භ අලංකාර ග්‍රන්ථයක් වන කාව්‍යාදර්ශය හෙළ බසට පෙරළීමෙන් සියබස්ලකර කතුවරයා කර ඇත්තේ මහාර්ඝ සේවාවක් ය, යන්න අවිවාදිතය. එහෙත්, සියබස්ලකරේ අන්තර්ගත ඇතැම් කරුණුවලින් සිංහල කවියාගේ ස්වාධීන චින්තනයට එරෙහි වැට කඩොලු සීමා බන්ධන පැනවීමක් සිදුවූ බවද ඇතැම් විද්වතුන්ගේ මතය යි. සිංහල ග්‍රන්ථයක් රචනා කරන විට ගද්‍යයෙන් නිර්මාණය කළ ද, පද්‍යයෙන් නිර්මාණය කළ ද ඒ සියල්ල බුද්ධ චරිතය හෝ බුද්ධ ධර්මය පැහැදිලි කිරීම සඳහා ම විය යුතුයැයි සියබස්ලකරේ සඳහන් වේ.

"පෙදෙන් බුදු සිරිතැ බසින් වත් සිරිත් ඈ
පද යුතු බසින් නළු ඈ අනතුරු ලකුණු දක්වම්"

බුද්ධ චරිතාදිය පද්‍යයෙන් වර්ණනා කළ යුතුය. වෘත චාරිත්‍රාදිය ගද්‍යයෙන් වර්ණනා කළ යුතුය. නාටකාදිය ගද්‍ය පද්‍ය මිශ්‍ර චම්පුවෙන් වර්ණනා කළ යුතුය. මෙයින් තදනන්තරව මහා කාව්‍ය ලක්ෂණ ප්‍රකාශ කරනු ලැබේ.[4]

බුද්ධ චරිතාදිය පද්‍යයෙන්ද වෘත චාරිත්‍රාදිය ගද්‍යයෙන්ද, නාටක චම්පුවෙන්ද බන්ධනය කළ යුතුය, යන්න සංස්කෘත අලංකාර ශාස්ත්‍රයේ දිස් නොවන සිංහලයට ආවේණික කොට ඉදිරිපත් කරන ලද අනුශාසනාවකි. සියබස්ලකරේ සඳහන් උක්ත අනුශාසනය පරිදි නම් බුද්ධ චරිතය හැර වෙනත් වස්තු විෂයක් අන්තර්ගත කොට පද්‍ය බන්ධනය කළ නොහැකි වූ අතර පසුකාලීන ගී කාව්‍ය රචකයන්ගේ කාව්‍ය නිර්මාණ සියල්ල බෞද්ධ ආගමික බලපෑමට ලක් වීමට මෙම නියමය මූලික වශයෙන් බල පෑ බව පෙනේ. ඉන් අනතුරුව සිංහල කවීන්ගේ පද්‍ය නිර්මාණයේ දී ජාතක කථා වස්තු රත්නාකරය වීය.[5]

බුදුදහම සුරක්ෂිතව තබා ගැනීමේ උදාර වගකීම හමුවේ දූරදර්ශී පාලකයකු වශයෙන් සියබස් ලකර කතුවරයාගේ උක්ත සටහන තුළින් බුදුදහමට සාධාරණත්වයක් සිදු විය. එහෙත් පටු ආගම්වාදී වෛෂයික සීමාවන් තුළ සිංහල කවියාගේ ස්වාධීන නිර්මාණශීලීත්වය කොටු කර තැබීමෙන් සිංහල කවියට සිදු වූයේ ඉමහත් අසාධාරණයක් යැයි කෙනෙකුට තර්ක කළ හැකි ය. ආගමික පරිසරයෙන් පරිබාහිරව සිතැගි පරිදි රමණීය නිර්මාණයන් සඳහා ඔවුන්ට තිබූ ඉඩ-කඩ උක්ත නියෝගයෙන් වාරණය විය. එහෙත් මෙම නිර්මාණශීලිත්වය උල්ලංඝනය කිරිමේ ප්‍රකාශයට එරෙහිව කිසිදු අරගලයක් දියත් කිරීමට තත්කාලීන කවීහු උත්සුක නොවූහ. සියබස්ලකර කතුවරයා එකල මෙරට රජ්‍ය නායකයා වීම නිසා ඔවුහු එම අදහස රාජ නියෝගයක් සේ සලකා ඊට ගරු කළා විය හැකි ය.

සියබස්ලකර වාරණ නියෝගයෙන් අඩපණ වූ සිංහල කවීහු ස්වකීය අභිමත වර්ණනා ඉදිරිපත් කිරීම සඳහා විකල්ප මාර්ගයන් සොයා ගියහ. එම ප්‍රයත්නයේ

අනිෂ්ට ප්‍රතිඵල වූයේ තථාගතයන් වහන්සේගේ ගුණ වැනීමේ මුවාවෙන් විවිධ ශෘංගාරාත්මක වර්ණනාවන්ගෙන් පරිපූර්ණ පද්‍ය කාව්‍ය ග්‍රන්ථ බිහිවීම ය. මුවදෙව්දාවත හා සසදාවත වැනි ප්‍රාථමික ගී කාව්‍යයන්ගෙන් ප්‍රකට වන්නේ එබඳු විකල්ප මාර්ගාවතීර්ණ කවීන්ගේ ප්‍රයත්නයන් ය. පොළොන්නරු හා දඹදෙණි වැනි විභූතිමත් යුගවල බිහි වූ කිසිදු ගී කාව්‍ය ග්‍රන්ථයකින් දේශීයත්වය පිළිබඳ හෝඩුවාවක් නොලැබීමත් සිය කාව්‍ය නිර්මාණ සඳහා ජාතක කථා වස්තු විෂය කර ගැනීමත් පූර්ව නිශ්චිත නිගමනයකට අනුව සිදුව ඇති බව පැහැදිලි ය.

මධ්‍යතන යුගයේ දී රචිත ජාතක කතා වස්තු කරගත් ගී කාව්‍ය අතරින් මුවදෙව්දාවතට ජාතක කථා සංග්‍රහයේ එන මඛාදේව ජාතකය වස්තු විෂය වේ. මුල් කථාවේ අභිමතාර්ථය බෝධිසත්වයන්ගේ අභිනිෂ්ක්‍රමණ පාරමිතාව විස්තර කිරීම හා තපසෙහි අගය ඉස්මතු කර පෙන්වීමයි.[6] ඒ අනුව මුවදෙව්දාවතේ කථාව මූලික වශයෙන් උපදේශාත්මක ස්වරූපයක් ගනී. මුවදෙව්දාවත කතුවරයා තම අරමුණු පැහැදිලි කළේ මෙසේ ය.

> ''හගිම්ද මා මෙනෙන් - ගුණ හිමියා කියන්නට
> පොහොම් නෙළුඹැ'සින වුනා - පලඳුත් හොත් තුසර තර''[7]

මුවදෙව්දාවත් කතුවරයාගේ පරමාර්ථය ඛණ්ඩ කාව්‍ය සම්ප්‍රදායට අනුගත වූ ක්‍රමයට මේ කථාව සිත් අලවන කාව්‍යයක් බවට පත් කිරීම ය. මෙය ඒ අවධියේ පැවති රසඥතාවට හා සම්ප්‍රදායටත් අනුකූල වෙමින් සම්මත කාව්‍ය සම්ප්‍රදායට අනුව බුදුන්ගේ ගුණ ගායනා කිරීමට දරන ලද ප්‍රයත්නයකි. මෙහි දක්නා සෑම වෙනස් කිරීමක් ම, සෑම එකතු කිරීමක් ම සිදු කර ඇත්තේ මුල් උපදේශාත්මක කථාව සංස්කෘත කාව්‍ය වංශයට අයත් වන ආචාරවාදී කාව්‍යයක් රචනා කිරීමට සුදුසු ප්‍රමාණවත් වස්තුවක් බවට පත් කිරීමේ අපේක්ෂාවෙනි. උතුම් පරපුරකට අයත් නායකයෙකු ගැන ජාතක කථාවෙන් කියවෙන අතර, අවසානයේ ඔහුගේ අපේක්ෂා මුදුන්පත් වීම ගැන ද සඳහන් වේ. හින්දු ආගමේ දැක්වෙන පුරුෂාර්ථ හතරෙන් අවසාන පුරුෂාර්ථය වන මෝක්ෂය සාක්ෂාත් කර ගැනීම එහි විස්තර වේ.

අභිනිෂ්ක්‍රමණය මෙයට පාදක වූ මනෝභාවය යි. ශාන්ත රසය මුඛ්‍ය රසය වන අතර කථාවේ තේමාව සම්පූර්ණයෙන් ම ආගමික වෙයි. අවසානයේ නායකයා ලබන ජයග්‍රහණය ආධ්‍යාත්මික වූවකි. එය නිර්භීතකම හා වීරත්වය නිසා ලබන ලෞකික වූ ජයග්‍රහණයක් නොවේ. සංස්කෘත කාව්‍ය ව්‍යවහාරයෙහි අවශ්‍යයෙන් ම වීර රසය හෝ ශෘංගාර රසය හෝ නිර්මාණය කළ යුතු බැවින් මේ ආගමික පදනම මහාකාව්‍යකට සුදුසු වන්නේ නැත. නායකයා නර කෙසක් දැකීම, ඔහු වනයට පිටත් වීම, තපස් රැකීම, අවසානයේ බ්‍රහ්මලෝකයේ උප්පත්තිය ලැබීම, යන ප්‍රධාන සිද්ධි අන්තර්ගත මෙම මුල් ජාතක කථාව සරල ලක්ෂණවලින් යුක්ත වේ. කතාවේ සිද්ධි පූර්ව නිශ්චිත අනුපිළිවෙළකට යෙදේ. එමෙන් ම එහි මූලික නාට්‍යමය ගැටුමක් නැත. එවැනි ගැටුමක් ඉදිරිපත් වන ලෙස කථාව වෙනස් කර ගැනීමට ඇති අවස්ථා ද අඩුය. කථාව තුළින් වර්ණනා අන්තර්ගත කිරීමට හැකි අවස්ථා එළඹෙන්නේ ද මඳ

වශයෙනි. 'රුවන් දිව්හි දනනට යුත්' යනුවෙන් සලකා කාව්‍ය ලක්ෂණ අතර බුදුගුණ වැනීම කාව්‍ය පරමාර්ථයක් කර ගැනීම නිසා මුවදෙව්දාවත කතුවරයා එය පිළිගෙන පැහැදිලිව ම ඒ නිගමනය ප්‍රකාශයට පත් කොට තිබේ. මුවදෙව්දාවත් කතුවරයා කවි සමයට අනුකූල වූ සංකල්ප දැක්වීමේ දී කාමාස්වාදයට හිතකර අදහස් පද්‍යවලට සම්බන්ධ කොට තිබේ.

මධ්‍යතන යුගයට අයත් දෙවන ජාතක කථා කාව්‍යය වන සසදාවතට ජාකත කථා සංග්‍රහයේ බෝධිසත්වයන්ගේ දාන පාරමිතාව විස්තර කෙරෙන සස ජාතකය වස්තු විෂය ලෙස යොදා ගෙන ඇත. තමා මේ කථාව සසදාවත යනුවෙන් සිංහල පද්‍යයට නැඟුවේ බුදු ගුණ ගායනා කිරීම පරමාර්ථය කොට ගෙන බව කතුවරයා එහි සඳහන් කරයි. සංස්කෘත අලංකාරවාදී ඛණ්ඩ කාව්‍ය සම්ප්‍රදායට හා ඒ ආකෘතියට අනුකූල කාව්‍යයක් රචනා කිරීම ඔහුගේ ද ප්‍රයත්නය වූ බව පැහැදිලි ව පෙනේ. බුදුන් වහන්සේගේ විශේෂ ගුණයක් ඉස්මතු කර දැක්වෙන කථාවක් කීමට අමතර ව, කවියා සංස්කෘත කාව්‍ය සම්ප්‍රදායට අනුකූල වීමේ අපේක්ෂාව ඇති ව එයට ම ගැළපෙන පරිදි කථා වස්තුවට බොහෝ දේ එකතු කිරීමටත් වෙනස් කිරීමටත් උනන්දු වී ඇත.[8] සසඳාවත කතුවරයාගේ ග්‍රන්ථ පරමාර්ථය මෙසේ විග්‍රහ කරයි.

"ඉති දු මුනි ගුණෙක් දෙස් - ගුණ මිණි මලෙව් දක්මට
මොකැසිරැ බඳ මන් මා - යුහු කෙළෙ සෙබේ සේ කිවි"[9]

සාම්ප්‍රදායික නීතිරීතිවලට අනුගත වෙමින් ත්‍රිවිධ රත්නයට නමස්කාර කෙරෙන ගී තුනකින් කාව්‍ය ආරම්භ වේ. බුදු ගුණයෙහි උදාරත්වය ගැන සඳහන් කරන කතුවරයා බුදු ගුණ වර්ණනා කිරීමට තමා අසමත් බවත්, එසේ වුවත් තමා අසාර්ථක ප්‍රයත්නයක යෙදෙන බවත් පවසයි.

මඛාදේව ජාතකය මෙන් ම, සස ජාතක කථාව ද එක් චරිතයක් හා එක් කේන්ද්‍රීය සිදු වීමක්, එනම් නායකයා සිය ශරීර මාංශ දන්දීම සඳහා ජීවිතය පරිත්‍යාග කිරීමේ පුවත වටා ගෙතුණු සරල කථාවකි. මෙහි තේමාව සම්පූර්ණයෙන් ආගමික වූ බැවින් සසදාවත අනුගමනය කළ කාව්‍ය සම්ප්‍රදායට එනම් සංස්කෘත මහාකාව්‍ය සම්පදායට අනුව කාව්‍ය නිර්මාණය කිරීම තරමක් අසීරු විය. කතාවේ ස්වභාවය අනුව මුඛ්‍ය තේමාව අරමුණට හානි නොවන ලෙස පිහිටා සිටි කල, ඉන් විවිධ රස නිර්මාණය කිරීමට අවස්ථා එළැඹෙන්නේ නැත. කථාවට ඓන්ද්‍රීය ලෙස සම්බන්ධ වන පරිදි සාම්ප්‍රදායික වර්ණනා ඇතුළත් කිරීමට අවකාශ ඇතතේ ද ඉතා මඳ වශයෙනි. එහෙත් එම වර්ණනා කෙසේ හෝ ඇතුළත් කරන කවියා සංස්කෘත සම්ප්‍රදායට තමා තුළ තිබෙන අත්‍යන්ත ආශාව මොනවට විදහා දක්වයි.[10]

සසදාවතේ කතා තේමාව ආගමික බැවින් මේ කෘතියේ මුඛ්‍ය රසය ශාන්ත රසය විය යුතු බව පහසුවෙන් ප්‍රකාශ කළ හැකි වුවත්, කථාවේ ස්වභාවය සැලකිලිමත්ව නිරීක්ෂණය කළ විට එහි බෝධිසත්ව චරිතය වීර සංකල්පයට අනුකූල වේ. ඒ චරිතයෙන් ආත්ම පරිත්‍යාගය දැක්වෙන බැවින් නිරූපණය විය යුතු භාවය

උත්සාහය වේ. ඒ අනුව කාව්‍යයේ මුඛ්‍ය රසය වීර රසය බව තීරණය කිරීම පහසු ය. සසදාවතේ කතාවස්තුව ඉදිරිපත් කර ඇති සංකීර්ණ ස්වභාවය නිසා, අවසානයේ දී වීර රසය ඒ අයුරින් ප්‍රබල ලෙස උද්දීපනය කිරීම අපහසු වී ඇත. යටත් පිරිසෙන් වර්ණනා දෙකක දී ප්‍රධාන රසය ලෙස උද්දීපනය කර ඇත්තේ ශාන්ත රසයයි. ඒ වර්ණනා නම් ජේතවන විහාර වර්ණනාව සහ බෝධිසත්වයන්ගේ ගුණවත් බව නිසා වනයේ ඇති වූ ශාන්ත බව පිළිබඳ වර්ණනාව යි.

බුදුන් වහන්සේ දම්සභාවට පැමිණීම විස්තර වන අවස්ථාවේ සිදු වූ ප්‍රාතිහාර්යක් ලෙසින් ඍතු වර්ණනාව දැක්වේ. ඍතු වර්ණනය කතුවරයා ඉදිරිපත් කිරීමට මගපාදා ගන්නේ ඍතු පැමිණියේ බුදුන්ට නමස්කාර කිරීම සඳහා යැයි ප්‍රකාශ කරමිනි. බුදුන් උතුම් බව පාඨකයාට ප්‍රකාශ කිරීමේ අරමුණ ඇතිව රචිත බැවින් මේ වර්ණනාව සාධාරණසේ පිළිගත හැකිය. ඒ වර්ණනාව උන්වහන්සේගේ ආධ්‍යාත්මික බලය හා අධිමානුෂික ගුණ කෙරේ මහා ගෞරවාන්විත හැඟීමක් ජනිත කරයි. උන්වහන්සේට සුව එළවමින් ස්වභාව ධර්මය පවා ගෞරව කරයි.

මධ්‍යතන යුගයට අයත් ගී කාව්‍ය ග්‍රන්ථ අතර අග්‍රගණ්‍ය වූත් වඩාත් පරිපූර්ණ වූත් කාව්‍ය කෘතිය වන්නේ කව්සිළුමිණ යි. පොදු සම්මතයට අනුව එය සම්භාව්‍ය යුගයට අයත් විශිෂ්ට ම සාහිත්‍ය කෘතිය වේ. කව්සිළුමිණේ අන්තර්ගත වන්නේ ජාතක කතා සංග්‍රහයේ එන කුස කතාවයි. කතුවරයාගේ පරමාර්ථය සංස්කෘත මහාකාව්‍ය නීති රීතිවලට අනුකූල වෙමින් රස භාව ජනනය කෙරෙන පරිදි මේ කතාව කීමයි. හුදු උපදේශාත්මක පරමාර්ථයක් ඇතිව එනම් මාතුගාමයන් කෙරේ ලොල් වූ කල්හි උත්තම පුරුෂයන්ට පවා නොයෙක් ව්‍යසනවලට මුහුණ දීමට වේ, යන උපදේශය දෙමින් පාඨක සිත් ස්ත්‍රීන් කෙරේ ඇලීමෙන් වැළැක්වීම සඳහා රචිත මුල් කතාවේ පරමාර්ථයට වඩා කාව්‍යයේ පරමාර්ථය වෙනස් වේ. කව්සිළුමිණේ පරමාර්ථය බොහෝ සෙයින් සෞන්දර්යාත්මක ය. මහා කාව්‍ය ඇතුළත් කරනු සඳහා ද සෞන්දර්යාත්මක ගුණය ඇති කිරීම සඳහා ද මුල් කථාව නොයෙක් වෙනස්කම්වලට භාජනය කරනු ලැබිණ.[11]

දඹදෙණි යුගයේ රචනා කරන ලද කව්සිළුමිණ පද්‍යයෙන් බුදු සිරිත වැනීම සඳහා රචනා කරන බව කතුවරයා විසින් ම ප්‍රකාශ කොට ඇතත් බුදු දහමේ දැක්වෙන විරාගික සංකල්පවලට වඩා ලෞකික ජීවිතයට සම්බන්ධ සරාගික සිද්ධි කෙරෙහි කව්සිළුමිණ කර්තෘවරයාගේ අවධානය යොමු වී තිබේ. විශේෂයෙන් ලෞකික ආශ්වාදයක් ලබා දීමට හේතුවන විවිධ වර්ණනා හා ප්‍රකාශන නිර්භීත ව ඉදිරිපත් කිරිමට කව්සිළුමිණ කතුවරයා සමත් වී ඇත. එහෙත් කව්සිළුමිණ කතුවරයා බුදු සිරිත දක්වන අතර ම තමා කළ සංශෝධන අතරට කාම ලෝකයක් ඇතුළු කිරීමට වග බලාගෙන තිබේ. ගද්‍ය කාව්‍ය රචකයාට වඩා පද්‍ය කාව්‍ය රචකයා ආගමික පරමාර්ථ ඉක්මවා යාමට ඉක්මන් වී ඇති සැටියක් ඉන් පෙනේ. පද්‍ය කාව්‍ය ග්‍රන්ථවල භාවිතයට ගත් බුදු සිරිත වැනීමේ අරමුණ තත්කාලීන ගද්‍ය කාව්‍ය රචකයන් ද නොවෙනස්ව පිළිගෙන තිබේ. බුදු ගුණ වැනීම සිංහල ගී කාව්‍ය රචනා

කිරිමේ අරමුණ ලෙස ගැනීමට හේතුව නම් සියබස්ලකර කතුවරයා ගද්‍ය පද්‍ය කාව්‍ය රචකයන් උදෙසා සම්මත කළ නීතිරීති මාලාව බව පැහැදිලි ය.

## සමාලෝචනය

අනුරාධපුර යුගයෙන් ආරම්භ වූ සිංහල පද්‍ය සාහිත්‍යය ගී කාව්‍ය ආකෘතිය මූලික කර ගනිමින් ක්‍රමිකව විකාශනය විය. සීගිරි ගීවලින් නිරූපණය වන ආකාරයට මුල්කාලීනව සිංහල ගී කාව්‍යයන්හි වස්තු විෂයෙහි පූර්ණ ස්වාධීනත්වයක් දැකිය හැකිය. එහෙත් පසුකාලීනව එනම් පොළොන්නරු හා දඹදෙණි යුගයන් වන විට ගී කාව්‍ය ආගම්වාදී පටු වෛෂයික සීමාවන් තුළ කොටු වී විකාශනය වනු පෙනේ. මෙයට මුඛ්‍ය වශයෙන් බලපා ඇත්තේ ක්‍රි. ව. 10 වන සියවසේ පමණ රචනා කරන ලද සියබස්ලකර නම් අලංකාරවාදී කාව්‍ය විචාර ග්‍රන්ථයෙන් සිංහල ගී කාව්‍ය රචකයන් පූර්ව නිශ්චිත මාර්ගෝප දේශනයක් මගින් බෞද්ධ ආගමික පසුබිමට සම්බන්ධ කිරීම හා පද්‍ය සාහිත්‍යකරුවන්ට එම සීමාව උල්ලංගනය කිරීමට නොහැකි වීමයි. අනුරාධපුර යුගයෙන් පසු රචනා කරන ලද මුවදෙව්දාවත සසදාවත හා කව්සිළුමිණ ග්‍රන්ථ ත්‍රිත්වයෙන් ම එය මැනවින් නිරූපණය වේ. නිර්මාණාත්මක බැවින් මෙම නිර්මාණ කොතරම් උසස් වුවත් මේ හැම පද්‍ය කාව්‍යයකම ආගමික බලපෑම කැපී පෙනෙයි. එසේ නොවන්නට මෙම කාව්‍ය නිර්මාණ මීටත් වඩා විශිෂ්ට නිර්මාණ වන්නට ඉඩ පැවති බව පැහැදිලිය.

### ආන්තික සටහන්

01. ගුණදාස අමරසේකර, (1932), *සිංහල කාව්‍ය සම්ප්‍රදාය*, බොරලැස්ගමුවඃ සීමාසහිත (පෞද්) විසිදුනු ප්‍රකාශකයෝ, 11 පිට.
02. එම, 46 පිට.
03. මාර්ටින් වික්‍රමසිංහ, (1997), *සිංහල සාහිත්‍යයේ නැඟීම*, දෙහිවලඃ සීමාසහිත තිසර ප්‍රකාශකයෝ, 14 පිට
04. ලේල්වල සිරිනිවාස හිමි, (2002), *සියබස්ලකර විවරණය*, කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 27 පිට
05. මාර්ටින් වික්‍රමසිංහ, (1991), *සාහිත්‍යෝදය කතා සහ සාහිත්‍ය කලාව*, දෙහිවලඃ තිසර ප්‍රකාශකයෝ, 21 පිට.
06. රොහිණී පරණවිතාන (පරිවර්තනය), (2009), 127 පිට
07. කෝන්තැන්නේ ආනන්ද හිමි, (2000), *මුවදෙව්දාවත සන්නය*, කර්තෘ ප්‍රකාශන, 4 පිට.
08. රොහිණී පරණවිතාන (පරිවර්තනය), (2009), 144 පිට
09. විමල විජයසූරිය, (1998) *සසදාවත*, කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 114 පිට.
10. සෝමපාල අරන්දර, (2007), *සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යය*, කොළඹ 10ඃ රත්න පොත් ප්‍රකාශකයෝ, 20 පිට
11. රොහිණී පරණවිතාන (පරිවර්තනය), (2009), 91 පිට